| | | |
|---|---|---|
| කොමසාරිස් ජනරාල්<br>ஆணையாளர் நாயகம்<br>Commissioner General | 011-2784815 | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව<br>கல்வி வெளியீட்டுத் திணைக்களம்<br>Educational Publications Department |
| ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2784815 | ඉසුරුපාය, බත්තරමුල්ල<br>இசுருபாய, பத்தரமுல்ல<br>Isurupaya, Battaramulla |
| වෙබ් අඩවිය<br>இணையத் தளம்<br>Web Site | www.edupub.gov.lk | මගේ අංකය<br>எனது இல.<br>My No. EPD /Dis/01/01 |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>e mail | commissioner_epd@yahoo.com | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. |
| දිනය<br>திகதி<br>Date | 2020/09/28 | |


චක්‍රලේඛ අංක 27/2020

සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

කොට්ඨාස භාර නි. අ. අ./ස. අ. අ. වරුන්,

රජයේ හා අනුමත පෞද්ගලික පාසල් විදුහල්පතිවරුන්,

පරිවේණාධිපතිවරුන් වෙත,

## පාසල් පෙළපොත් නැවත භාවිත කිරීම.

රජය විසින් වාර්ෂිකව සියලු ම රජයේ පාසල්, අනුමත පෞද්ගලික පාසල් හා පිරිවෙන්වල අධ්‍යාපනය ලබන සිසුන්ට සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් වර්ග 410කින් යුත් පෙළපොත් පිටපත් මිලියන 40ක ප්‍රමාණයක් නොමිලේ සපයනු ලැබේ. පෙළපොත් මුද්‍රණය හා බෙදාහැරීම සඳහා රජය විසින් වසරකට දරනු ලබන වියදම රුපියල් මිලියන 4500 ඉක්මවයි.

02. මෙලෙස විශාල මුදලක් වැය කර සම්පාදිත පෙළපොත් නැවත භාවිතය සඳහා යෝග්‍ය වන පරිදි භාවිත කිරීමේ වගකීම සිසු දරුවන්ට පැවරෙන අතර ඒ සඳහා ඔවුන්ට මඟ පෙන්වීමේ වගකීම විදුහල්පතිවරුන්ට, ගුරු භවතුන්ට හා දෙමාපියන්ට පැවරේ. පෙළපොත් හැකි උපරිම ප්‍රමාණයක් නැවත භාවිත කිරීම මගින් ඉතිරි වන මහජන මුදල් අධ්‍යාපන ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් වැය කිරීමට රජයට හැකි වේ.

03. මේ නිසා සෑම වර්ෂයක ම භාවිත කළ පෙළපොත් අතුරෙන් අවම වශයෙන් 30%ක පමණ ප්‍රමාණයක් නැවත භාවිත කිරීමට පියවර ගත යුතු අතර ඒ සම්බන්ධයෙන් පහත නිර්ණායක අනුව කටයුතු කිරීම අවශ්‍ය වේ.

| ශ්‍රේණිය | පෙළපොත් ආපසු ලබා ගැනීම |
|---|---|
| 1, 2, 3, 4, 5 | ආපසු ලබා ගැනීම අවශ්‍ය නොවේ. |
| 6, 7, 8, 9 | වර්ෂ අවසානයේ දී ලබා ගත යුතු ය. |
| 10, 11 | මේ ශ්‍රේණිවල අ.පො.ස./උසස් පෙළ පන්ති ආරම්භ කරන දිනයේ හෝ උසස් පෙළ සඳහා වෙනත් පාසලකට යෑමට බැහැර යාමේ සහතිකය ලබා ගන්නා අවස්ථාවේ දී ලබා ගත යුතු ය.<br>අ.පො.ස./සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි කිසියම් සිසුවෙක් යම් විෂයකට නැවත පෙනී සිටීමට අපේක්ෂා කරන්නේ නම් එම විෂයට අදාළ පෙළපොත් ආපසු ලබා නොගත යුතු ය. සාමාන්‍ය පෙළ විභාගයේ සියලු විෂයන්ට නැවත පෙනී සිටින්නේ නම් එවිට ද පෙළපොත් ආපසු ලබා නොගත යුතු ය. |

04. පහත තත්ත්වයේ පෙළපොත් නැවත භාවිතයට නොගත යුතු ය.

4.1 පිටු ඉරී තිබීම/ කොන් නැමී තිබීම/ පිටු ගැලවී තිබීම
4.2 පිටකවරය ගැලවී තිබීම/ ඉරී තිබීම

4.3 පිටුවල සටහන් යොදා තිබීම/ පාට කර තිබීම/ කොටස් කපා ඉවත් කර තිබීම
4.4 අභ්‍යාස සඳහා පිළිතුරු පෙළපොතෙහි ම සටහන් කිරීම (වැඩ පොත් සඳහා අදාළ නොවේ)

කෙසේ වුව ද සමස්ත තත්ත්වය අනුව එය නැවත භාවිත කිරීමට සුදුසු පොතක් බව පෙළපොත් භාර ගුරුභවතුන්ට හැඟී යන්නේ නම් එම පොත් නැවත භාවිතයට ගත යුතු වේ.

05. සිසුන්ට පෙළපොත් නිකුත් කිරීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කළ යුතු ය.

5.1 කිසිදු අවස්ථාවක කිසිදු සිසුවෙකුට දෙන පොත් සියල්ල භාවිත කළ පොත් නොවිය යුතු ය.
5.2 සියලු ම සිසුන් සමාන ලෙස සලකා භේදයකින් තොරව නව හා භාවිත කළ පෙළපොත් සුදුසු පරිදි මිශ්‍රව ලබා දීමට පියවර ගත යුතු ය.

06. පෙළපොත් පරිහරණය කිරීම පිළිබඳව පහත කරුණු සම්බන්ධයෙන් සිසුන් දැනුවත් කළ යුතු ය.

6.1 පෙළපොත්වල සටහන් තැබීම, වර්ණ ගැන්වීම නොකළ යුතු බව
6.2 රූප සටහන් කපා ඉවත් නොකළ යුතු බව
6.3 පිටු ගලවා ඉවත් කිරීම, නැවීම, ඉරා දැමීම නොකළ යුතු බව
6.4 පෙළපොත්වලට හානි නොවන පරිදි පාසල් බෑගයේ පොත් අසුරා ගත යුතු බව
6.5 පෙළපොත්වලට හානි නොවන පරිදි පිටකවර දමා ගත යුතු බව

07. මෙම ක්‍රියාදාමය සම්බන්ධයෙන් විදුහල්පතිවරයාගේ අධීක්ෂණය යටතේ පෙළපොත් භාර ගුරුවරයා හා පන්ති භාර ගුරුවරයා සිය වගකීම කැපවීමෙන් ඉටු කළ යුතු අතර අදාළ වාර්තා හා සංඛ්‍යා ලේඛන (සී ආර් පොතක් හෝ ලිපි ගොනුවක් මගින්) නිවැරදිව පවත්වා ගත යුතු ය. පෙළපොත් භාවිතය පිළිබඳව අධීක්ෂණය කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයෙන්/ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන්/ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන්/ කලාප අධ්‍යාපන කාර්යාලයෙන්/ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් නිලධාරීන් පැමිණි විට අදාළ ලේඛන හා වාර්තා ඉදිරිපත් කළ යුතු ය.

08. විෂයමාලා වෙනස් වීමෙන් හෝ භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත් වීමෙන් හෝ ඉවත් කරන ලද පෙළපොත් 2014. 02. 20 දිනැති අංක 2014/01 හා 2017. 01. 30 දිනැති අංක 2014/01(i) දරන අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තු චක්‍රලේඛවල විධිවිධාන අනුව අපහරණය කිරීමට කටයුතු කළ යුතු ය.

09. මෙම පෙළපොත් නැවත භාවිත කිරීමේ ක්‍රියාදාමය මගින් හුදෙක් මහජන මුදල් ඉතිරි කර ගැනීම පමණක් ම නොව සිසුන් තුළ සම්පත් අරපරෙස්සමින් භාවිතය, පරිත්‍යාගශීලීත්වය වැනි යහපත් ආකල්ප වර්ධනය ද අපේක්ෂා කෙරේ.

10. ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පාසලේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වන විදුහල්පති වෙත පෙළපොත් නැවත භාවිත කිරීමේ කාර්යභාරයෙහි මූලික වගකීම මෙයින් පවරමි.

ජාතික වැදගත්කමකින් යුත් ඵලදායී කර්තව්‍යයක් සේ සලකා මේ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට අවශ්‍ය පූර්ණ සහයෝගය ලබා දෙනු ඇතැයි උදක් ම අපේක්ෂා කරමි.

මේ සම්බන්ධයෙන් මීට පෙර අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ සියල්ල මෙයින් අවලංගු වේ.

මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

**මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා**
**ලේකම්**
**අධ්‍යාපන අමාත්‍යාංශය**
**"ඉසුරුපාය"**
**පැලවත්ත,**
**බත්තරමුල්ල**